# වමේ බලයක් ගොඩනැගිය හැක්කේ කෙසේද?

ඉහත මාතෘකාව යටතේ මගේ පැරණි මිතුරෙකු වන මහනුවර ලලිත් අබේසිංහ සහෝදරයා “වමේ හඬ” පුවත් පතට ලියන ලද ලිපියකින් වැදගත් සාකච්ඡාවක් ආරම්භකර තිබුණි.

වමේ ව්‍යාපාරය ගොඩනැගීම ගැන වෙහෙසෙන ක්‍රියාධරයින්ට එම ලිපිය මගින් ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්ණ වලට පිළිතුරු සොයා ගැනීම අවශ්‍යයැයි මට හැඟේ’ එම සංවාදයට අදහස් කීපයක් එකතු කිරීමට උවමනාව තිබුනද විවිධ කටයුතු නිසා එය තරමක් ප්‍රමාධ විය. ලලිත්ගේ ලිපියෙන් පිළිතුරු සැපයිය යුතු වැදගත් ගැටලු කීපයක් මතුකර තිබේ. 70 දශකයේ මැදභාගයේ වමේ ව්‍යාපාරයට ශිෂ්‍යයෙකු ලෙස (නව සමසමාජයට) සම්බන්දවූ ලලිත් වමේ ව්‍යාපාරයේ උන්නතිය වෙනුවෙන් සටන්වැදීම නිසා සිය විශ්ව විද්‍යාල අධ්‍යාපනය පවා අහිමිකර ගත්තෙකි. 80 වැඩ වර්ජනය පරාජය සමග ලාංකේය වෘත්තීය සමිති ව්‍යාපාරය විශාල ඇඳ වැටීමකට ලක්වූ අතර වමේ ව්‍යාපාරයටද පරාජයන් ගණනාවකට මුහුණ දීමට සිදුවිය. වසර 40කට පමණ පසු තවමත් වම ගැන බලාපොරොත්තු තබාගෙන සිටින ලලිත් වම අද තිබෙන්නේ කොතැනද යන ප්‍රශ්ණය උපේක්ෂා සහගතව මතු කිරීම සාධාරණයි. ඇත්තටම ඔහුගේ ලිපිය බලාපොරොත්තු බිඳවැටුණු වාම ක්‍රියාදරයෙකුගේ අහිංසක ප්‍රකාශනයකි.

එසේ වුවද ඔහු වම ගොඩනැගීම සඳහා ඉදිරිපත් කරන ප්‍රවාදය වැදගත් එකකි. ලාංකේය වමේ ව්‍යාපාරය අද පවතින මට්ටමටම පත්වීම හුදෙක් තනි සිදුවීමක් නොවන අතර එය ජාත්‍යන්තර හා ජාතික දේශපාලන වර්ධනයන් හා බැඳී පවතී. 1990 දී සෝවියට් දේශය ඇතුලු සමාජවාදී නාමයෙන් පැවැති (සැබෑ සමාජවාදයක් මෙම රටවල නොතිබූ බව මෙයින් අවධාරණය කෙරේ) රාජ්‍ය පද්ධතිය බිඳවැටීම තුලින් ලෝක සමාජවාදී ව්‍යාපාරයට ඇති කල පරාජය සුලුපටු නොවේ. ඉන් අනතුරුව සීතල යුද්ධය අවසන්වීම සමග ඉතිහාසය අවසාන බවද නවලිබරල්වාදය එකම දේශපාලන දර්ශනය බවට පත්ව ඇති බව ෆ්‍රැන්සිස් ෆුකුයාමා නැමැති දර්ශනවාදියා විසින් ප්‍රකාශ කරන ලදී. එසේ වුවද ඉන් දශක දෙකහමාරක් පමණ ගෙවීයන විට අද ජාත්‍යන්තර පරිමාණව විද්‍යාමාණවී ඇත්තේ ගැඹුරු අර්බුදයකට ධනේෂ්වර ක්‍රමය ගමන් කරමින් තිබෙන බවයි. ධනේෂ්වර ක්‍රමය තුළ අතිරික්ත වටිනාකම හා ශ්‍රම සූරාකෑම පවතින තාක් පංති අරගලය අඛණ්ඩව පවතින අතර අවසන් වශයෙන් එම ගැටුම ධනේෂ්වර ක්‍රමය පෙරලා දමා සමාජවාදී ලෝක පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා නොනවත්වා ගමන් කරමින් තිබෙන බව යටපත් කිරීමට සමත් ජගතෙකු තවමත් බිහිවී නැති.

එසේම අපරට තුළ වමේ පැරණි නායකයින් පංති සටන් මාවත අත්හැරදමා 1964 සිට ධනපති පංතිය සමඟ ආරම්භ කළ මහජන පෙරමුණු සභාග දේශපාලනය විසින් සිදුකල පාවාදීම අද දක්වාම ඇදීයයි. මෙම පාවාදීමේ බරපතලකම තේරුම්ගෙන ධනපති විරෝධී පංති සටන් මාවතට කම්කරු පංතිය නැවත අවතීර්ණ කිරීම වම ගොඩනැගීමෙහිලා මුහුණදෙන ප්‍රධාන අභියෝගයකි. ධනපති හවුල් දේශපාලනය සමගින් ඇතිකරන ලද දැවැන්ත විනාශයෙන් ගොඩඒමට අප තවම අසමත්වී ඇති බව මෙහිලා තේරුම්ගත යුතුයි. අලුත් වම ලෙස හඳුන්වා ගන්නා ජනතා විමුක්ති පෙරමුණ හා නසසපයේ වික්‍රමබාහු වැනි අය වර්තමාන ධනපති ආණ්ඩුව සමග අනියම් සභාග දේශපාලනයක නිරතව සිටීම මෙම ප්‍රශ්නය තවත් ත්‍රිවුකර ඇති.

වම ගොඩනැගීම සම්බන්දයෙන් මාක්ස්වාදී මූලික සිද්ධාන්තයන්ගෙන් බැහැර නොවිය යුතු බව ලලිත් ප්‍රකාශ කලද කොමියුනිෂ්ට් ප්‍රකාශනය වසර 150කට වඩා පැරණි බැවින් එය අලුත්වීමක් අවශ්‍ය බව ඔහු ප්‍රකාශ කරයි. “වම අප්ඩේට්” විය යුතුයි කියා ප්‍රකාශ කිරීමෙන් ඔහු අර්ථ ගන්වන්නේ එයයි. ජාත්‍යන්තර වශයෙන් හා අප රටේද සමහර බුද්ධිමතුන් මාක්ස්වාදයට විවිධ අර්ථකථනයන් දීමට දරණ උත්සාහයන් අපට නිතර දක්නට ලැබේ.

මාක්ස්වාදය මුලුමනින්ම ප්‍රතික්ෂේප නොකරන බව කියන මෙවැනි “බුද්ධිමතුන්” මාක්ස්වාදය සියුම් ලෙස විකෘති කිරීම හරහා කම්කරු පංති ක්‍රියාධරයින් හා සටන්කාමී තරුණයින් අතරමං කිරීම සිදු කෙරමින් පවතී. උදාහරණයක් ලෙස පශ්චාත් නූතන මතවාදය විසින් ඇතිකරන ලද වියවුල සුළුපටු නොවේ. මාක්ස්වාදීන් ලෙස හඳුන්වා ගන්නා බොහෝ තරුණ කොටස් මෙම පටලැවිල්ල තුල තවමත් හිරවී මාක්ස්වාදය අච්චාරුවක් බවට පත්කරගෙන තිබෙන බව එවැනි කොටස්වල ලිපි ලේඛණ වලින් ප්‍රදර්ශණයවේ. ධනේෂ්වර ලෝකයේ සිදුවන සියලු නව වර්ධනයන් තේරුම් කිරීමට සමත් විද්‍යාත්මක විග්‍රහයක් මාකාස්වාදයට තිබෙන බව අවිවාදිතයි.

සංශෝධනවාදී මතවාදයන් යම් පටුසීමාවන් තුල තරුණ කොටස් අතර තාවකාලික ජනප්‍රිය බාවයකට පත්වුවද අවසන් ප්‍රතිපලය වන්නේ පංති ව්‍යාපාරය අවුලට ඇදදමා ධනේශ්වර ක්‍රමයේ පැවැත්මට අනියම් රැකුලක්වීමයි. කම්කරු පංතිය ප්‍රමුඛ පීඩිත ජනතාවට එරෙහිව සමාජ ප්‍රතිවිප්ලවකාරී ක්‍රියාදාමයක් දියත්කර තිබෙන නවලිබරල්වාදී ක්‍රමය පරාජය කිරීම සඳහා සංවිධානයවීම හැර වෙනත් විකල්පයක් නොමැති පසුබිමක කම්කරු පංති ව්‍යාපාරය හා වෘත්තිය සමිති කම්කරු පංති දේශපාලනයෙන් ඉවත්කර හුදු වෘත්තීය සමිතිවාදී සටන්පාඨ වල ගැට ගැසීමට දරණ උත්සාහය බරපතල විපාක අත්පත්කර දෙනු ඇති. මෙවැනි කොටස් දේශපාලන පක්ෂ විරෝධී ලෙස හැසිරීම පොදු ලක්ෂණයක් වන අතර ඔවුන් නියෝජනය කරන්නේ පසුගාමී කම්කරු පංති ස්ථරයේ විඥාණයයි.

දූෂිත ධනපති ආණ්ඩු පාලකයන්ට එරෙහිව පුලුල් මහජන ව්‍යාපාර විවිධ රටවල දැකිය හැකිවුවත් ඒ ජනතා නැගිටීම් කම්කරු පංතික බලයක් පිහිටුවීම කරා ගමන් කරන වැඩ පිළිවෙළකින් වියෝවීම හේතුකොටගෙන අතරමංව පරජයන් කරා ගමන් කිරීමද සිදුවියි. පසුගිය කාලය තුල විශාල කථිකාවකට ලක්වූ අත්පත් කරගැනීමේ ව්‍යාපාරය (occupy movement) හා අරාබි උදානය වැනි ව්‍යාපාරයන්ට අත්වූයේ එවැනි ඉරණමකි. එවැනි ව්‍යාපාරවල පොදු ලක්ෂණයන් වූයේ මර්ධනයට හා දූෂණයන්ගෙන් තොර ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ගැන හිස් බලාපොරොත්තුන්යි. එනම් දූෂිත ධනපති ක්‍රමය පිළිසකර කළහැකිය යන අන්ධ විශ්වාසයයි. ගෝලීය ධනවාදී නවලිබරල් ආර්ථික ක්‍රියාවලිය තුල ඊට විකල්ප සමාජවාදී බලයක් ගොඩනැගීම ඉලක්ක කිරීමකින් තොරව ගෙනයන එවැනි ජන අරගල හා සටන් සාර්ථකත්වයකින් තොරව අවසන්වීම අප දකින්නේ එම නිසායි. අද වම ඉදිරියේ පවතින කාර්යභාරය වන්නේ මාක්ස්වාදය අලුත් කිරීම ගැන වෙහෙසීම නොව මාක්ස්වාදයේ මූලධාර්මික

අර්ථයන් කම්කරු පංතිය හා තරුණ ව්‍යාපාරය අතර ප්‍රචලිත කිරීම වෙනුවෙන් විශ්වාසයකින් යුතුව අලුත් භාවිතාවක යෙදීමයි.

ගෝලියකරණය ඇතුලෙ වම ගොඩනැගීමට නම් ජාත්‍යන්තරවාදය නැතිනම් අවම වශයෙන් කළාපීය වශයෙන් සංවිධානය වීමේ අවශ්‍යතාවය ගැන ලලිත් කරන අවධාරණය වැදගත්යි. මාක්ස් එංගල්ස්ගේ හා ලෙනින්ගේ ජායාරූප විශාල වශයෙන් ප්‍රදර්ශන භාණ්ඩ බවට පත්කර කටයුතු කරන වම වශයෙන් පෙනීසිටීමට උත්සාහ කරන ජනතා විමුක්ති පෙරමුණ වැනි සුළු ධනේශ්වර පක්ෂවලට එවැනි ජාත්‍යන්තර ඉදිරි දර්ශනයක් ඇත්තේම නැති. පැරණි සමසමාජ හා කොමියුනිෂ්ට් පක්ෂවලද පෙර කාලයේ පැවැති සීමිත ජාත්‍යන්තරවාදයක් හෝ වර්තමානයේ ඇත්තේ නැති. උදාහරණයක් ලෙස පිදෙල් කැස්ත්‍රෝ පිළිබඳ අනුස්මරණ උත්සව පැවැත්වීම හෝ ඇමරිකාවේ ඩොනල් ට්‍රම්ප් ජනාධිපතිවීම යන ජාත්‍යන්තරක වැදගත් සිදුවීම් ගැන අදහස් දැක්වීම හෝ මැයි දිනය බටහිර සුදු ජාතිකයින් සහභාගිකිරීමෙන් මාක්ස් අවධාරණය කළ කම්කරු පංති ජාත්‍යන්තරවාදය ගොඩනැගීම නම් නොවන බව අවධාරණයෙන්ම සටහන් කළ යුතුයි.

අප ගොඩනගන වම කුමක්ද යන්න නිර්වචනය කර ගැනීම අවශ්‍ය වන අතර ඒ මත පුලුල් වමේ ගොඩනැගීම කළ හැක්කේ කෙසේද යන්න ගැන ගැඹුරු කතිකාවක් නැවත ආරම්භ කිරීමේ වැදගත්යි. නව තත්වයන්ට ගැලපෙන ලෙස වම අලුත් විය යුතුය යන අවධාරණය ඉතා ප්‍රවේශමෙන් විමසා බැලිය යුත්තකි. නවීන තාක්ෂණය හා නව ප්‍රචාරණ යාන්ත්‍රණයන් වම ජනප්‍රිය කරවීම සඳහා යොදා ගැනීම කෙරෙහි අවධානය යොමුකල කළ යුතුය යන්න ගැන විවාදයක් ඇතැයි මම නොසිතමි. එහෙත් වම ගොඩනැගීමට කෙටි මාවතක් නොමැති බව තේරුම් ගැනීමද අවශ්‍යයි. මෙම කරුණු කීපය සඳහන් කලේ වම ගොඩනැගීම ගැන සිදුවන සාකච්ජාව පෝෂණය කිරීමේ අටියෙනි.

රතුකොඩි වැඩි වැඩියෙන් ප්‍රදර්ශනය කළ පමණින් හෝ සංදර්ශණ පැවැත්වීමෙන් ඒවා වමේ ව්‍යාපාර වන්නේ නැති. මාක්ස් අවධාරණය කල පරිදි ජාත්‍යන්තරවාදය වමේ මූලික අත්තිවාරම විය යුතුවා සේම ජාතික ප්‍රශ්ණය වැනි සංවේදී ප්‍රශ්න වලදී නිවැරදි ස්ථාවරයක පිහිටීමද වම හදුනාගැනීමේ නිර්නායකයන්වෙයි. අපවැනි අඩු දියුණු රටක ජාතික ප්‍රශ්ණය වැනි සංවේදී ප්‍රශ්න වලදී දෙමළ ජනතාවගේ ස්වයංනිර්ණය අයිතිය පිළිගැනීම එවැනි කඩඉමකි. එවැනි පදනමකින් ගොඩනගනු ලබන විප්ලවවාදී වම බහුජන කම්කරු පක්ෂයක් ගොඩනැගීම යන ඉදිරි දර්ශණයක් සහිත විය යුතුය. ධනපති ආණ්ඩුවේ කප්පාදුවට එරෙහිව තැනින් තැන මතුවන කම්කරු" ධීවර" ශිෂ්‍ය" ගොවි සටන්වලට මැදිහත්විය හැකි හා ඒවාට නායකත්වයක් දියහැකි ක්‍රමවේදයන් ප්‍රගුණ කිරීම වමේ කාර්යභාරයයි. ඒ සමග මාක්ස්වාදී මූලධර්ම මත පිහිටා කටයුතු කරන වමේ කණ්ඩායම් අතර සිදු කෙරෙන ගැඹුරු සාකච්ජාවන් හරහා එක්සත් වමක් ගොඩනැගීමට තිබෙන ඉඩකඩ කෙරෙහි අවධානය යොමු කිරීමද වැදගත් වන අතර එමගින් විසිරී සිටින වමේ ක්‍රියාධරයින්හට වම ගොඩනැගීම ගැන විශ්වාසයක් ජනිත කිරීමට ඉවහල්වනු ඇත.